Lesson 14

# Children like sweetmeats

ළමයි පැණි රහට කැමතියි

සාමාන්‍යයෙන් කරන ක්‍රියා

ක්‍රියා පද

Verbs (වර්බ්ස් )

යම් ක්‍රියාවක් ප්‍රකාශ කරන පදයට තමයි ක්‍රියා පදයක් කියන්නේ, ඇත්තටම  කරන හෝ සිදුවෙන ක්‍රියාවක් තමයි ක්‍රියා පදයකින් කියවෙන්නේ . අපි මීට පෙර කළ පාඩමකදී (can පාඩමේදී) ක්‍රියාපද කිහිපයක් සඳහන් වුනා. නමුත් මෙම පාඩමේ සිට ඉදිරි පාඩම් කිහිපයකදී ක්‍රියා පද වැඩි ප්‍රමාණයක් සහ ඒවා භාවිතය පිළිබඳ වැඩිදුර ඉගෙන ගන්නවා.

අපි මුලින්ම සුලභ ක්‍රියාවන් ප්‍රකාශ වන ක්‍රියාපද කිහිපයක් ඉගෙන ගනිමු.

| | | | | |
|---|---|---|---|---|
| Go | - | ගෝ | - | යනවා |
| Play | - | ප්ලේ | - | සෙල්ලම් කරනවා |
| Come | - | කම් | - | එනවා |
| Sleep | - | ස්ලීප් | - | නිදාගන්නවා |
| Eat | - | ඊට් | - | කනවා |
| Say | - | සේ | - | කියනවා |
| Drink | - | ඩ්‍රින්ක් | - | බොනවා |
| Read | - | රීඩ් | - | කියවනවා |
| Give | - | ගිව් | - | දෙනවා |
| Write | - | රයිට් | - | ලියනවා |
| Take | - | ටේක් | - | ගන්නවා |

| | | | | |
|---|---|---|---|---|
| Watch | - | වොච් | - | නරඹනවා |
| See | - | සී | - | දකිනවා |
| Look | - | ලුක් | - | බලනවා |
| Do | - | ඩූ | - | කරනවා |
| Wash | - | වොෂ් | - | හෝදනවා |
| Work | - | ව(ර්)ක් | - | වැඩකරනවා |
| Speak | - | ස්පීක් | - | කතාකරනවා |
| Ask | - | ආස්ක් | - | අහනවා |
| Clean | - | ක්ලීන් | - | පිරිසිදු කරනවා |
| Buy | - | බයි | - | මිලට ගන්නවා |
| Learn | - | ල(ර්)න් | - | ඉගෙන ගන්නවා |
| Sweep | - | ස්වීප් | - | අතුගානවා |
| Sell | - | සෙල් | - | විකුණනවා |
| Hear | - | හිය(ර්) | - | ඇහෙනවා |
| Win | - | වින් | - | දිනනවා |
| Cry | - | ක්‍රයි | - | අඬනවා |
| Think | - | තිංක් | - | හිතනවා |
| Understand | - | අන්ඩ(ර්)ස්ටෑන්ඩ් | - | තේරුම් ගන්නවා |

හොඳයි, මීළඟට බලමු ඉහත ක්‍රියා යොදා ගනිමින් සාමාන්‍ය ක්‍රියාවක් ප්‍රකාශ කරන්නේ කොහොමද කියලා. සාමාන්‍ය ක්‍රියාවක් කියන්නේ අපි සාමාන්‍යයෙන් එදිනෙදා කරන ක්‍රියාවක් .මෙහිදී ක්‍රියා පදයේ මූලික රූපය, එනම් ඔය ඉහත සදහන් සදහන් රූපය තමයි යොදා ගැනෙන්නේ.

- මෙහිදී මතක තබා ගත යුතුයි ඉංග්‍රීසි භාෂාවේ වාක්‍යයක් සෑදීමේදී සාමාන්‍යයයෙන් මුලට එන්නේ කතෘ. දෙවනුවට ක්‍රියාව. ඊට පසුව කර්මය සහ ඉතිරි අනෙකුත් පද. **කතෘ +ක්‍රියාව +කර්මය +ඉතිරිය**

ඊළගට මෙන්න මෙහෙම වැදගත් ව්‍යාකරණ නීතියක් තියෙනවා ඉංග්‍රීසි භාෂාවේ. එය හොදින් මතක තබා ගත යුතුයි

- ***සාමානයෙන් කරන හෝ සිදුවන ක්‍රියාවන් ප්‍රකාශ කිරීමේදී වාක්‍යයයේ කතෘ ඒක වචන නම් ක්‍රියාපදය අගට S අකුරකුත් එකතු කළ යුතු වෙනවා. එය ව්‍යාකරණ නීතියක්*** .

  ( නමුත් I සහ You සමඟ විතරක් එසේ වන්නේ නෑ. I සහ You සාමාන්‍යයෙන් බහු වචන මෙන් සලකා ක්‍රියා කෙරෙන්නේ )

උදාහරණ වාක්‍යය ගෙන බලමු

I go to school everyday

අයි ගෝ ටු ස්කූල් එව්රිඩේ

මම හැමදාම ස්කෝලේ යනවා.

I do my homework in the evening

අයි ඩූ මයි හෝම්ව(ර්)ක් ඉන් දි ඊව්නිං

මම හැන්දෑවට මගේ ගෙදර වැඩ කරනවා.

I like cartoons

අයි ලයික් කාටූන්ස්

මම කාටුන් වලට කැමතියි

We watch the news on television

වී වොච් ද නිව්ස් ඔන් ටෙලිවිෂන්

අපි රූපවාහිනියේ ප්‍රවෘත්ති බලනවා

You do it very well

යූ ඩූ ඉට් වෙරි වෙල්

ඔයා ඒක ගොඩක් හොඳට කරනවා.

They work hard

දේ ව(ර්)ක් හාඩ්

ඔවුන් මහන්සියෙන් වැඩ කරනවා

Children like sweetmeats

චිල්රන් ලයික් ස්වීට්මීට්ස්

ළමයි පැණිරස කෑම වලට කැමතියි.

ඉහත වාක්‍යය වල කතෘ වරුන් විදියට යෙදී තිබෙන්නේ I , you සහ we , they , children වැනි බහු වචන . ඉහත සදහන් ව්‍යාකරණ රීතියට අනුව ඉහත වාක්‍යය වල ක්‍රියාපදය අගට s අකුරක් එන්නේ නැහැ . අපි ඊළගට ඒක වචන කතෘ වරුන් යෙදෙන වාක්‍යය කීපයක් ගෙන බලමු. ඒවායේ ක්‍රියා පදය අගට s අකුරක් එනවා

My father work<u>s</u> in a bank

මයි ෆාද(ර්) ව(ර්)ක්ස් ඉන් අ බෑන්ක්

මගේ තාත්තා බැංකුවක වැඩ කරන්නේ

My mother cook<u>s</u> well

මයි මද(ර්) කුක්ස් වෙල්

මගේ අම්මා හොඳට උයනවා

She takes me to school

ෂී ටේක්ස් මී ටු ස්කූල්

ඇය මාව ස්කෝලෙට ගෙනියනවා

My father reads newspapers

මයි ෆාද(ර්) රීඩ්ස් නිව්ස්පේප(ර්)ස්

මගේ තාත්තා පත්තර කියවනවා

My brother plays cricket

මයි බ්‍රද(ර්) ප්ලේස් ක්‍රිකට්

මගේ සහෝදරයා ක්‍රිකට් සෙල්ලම් කරනවා

Chanika sings nicely

චානිකා සිංග්ස් නයිස්ලි

චානිකා ලස්සනට ගායනා කරනවා

ඉහත වාක්‍යය වලින් දැක්වෙන ක්‍රියා එකක්වත් මේ අවස්ථාවේ කරමින් ඉන්නවාය කියලා අපට කියන්න බෑ. එම කතෘවරුන් විසින් අදාල ක්‍රියාවන් යම්කිසි අවස්ථාවක සිදු කරනවා. එය බොහෝ විට දින චර්යාවක් වශයෙන් වෙන්න පුළුවන්. පුරුද්දක් වශයෙන් වෙන්න පුළුවන්. ඉහත වාක්‍යය වලින් කියන්නේ සාමාන්‍යයෙන් එම ක්‍රියාවන් සිදු කරනවා කියල විතරයි . ඒ නිසා තමයි ඒවාට සාමාන්‍ය ක්‍රියා කියල කියන්නේ

අපි තවත් උදාහරණ ගෙන බලමු.

Our teacher teaches us well

අව(ර්) ටීච(ර්) ටීචස් අස් වෙල්

අපේ ටීච(ර්) අපට හොඳට උගන්වනවා.(teach කියන ක්‍රියා පදයට s එකතු වෙද්දී e අකුරක් සමග es ලෙස එකතු වෙන්නේ . එවිට ශබ්ධ කෙරෙන්නේ ටීචස් කියල )

Dogs bark at night

ඩොග්ස් බා(ර්)ක් ඇට් නයිට්

රෑට බල්ලෝ බුරනවා.

Farmers work hard

ෆාම(ර්)ස් ව(ර්)ක් හාඩ්

ගොවියන් මහන්සියෙන් වැඩ කරනවා

The sun gives us light

ද සන් ගිව්ස් අස් ලයිට්

ඉර අපට එළිය දෙනවා.

I read story books

අයි රීඩ් ස්ටෝරි බුක්ස්

මම කතා පොත් කියවනවා.

Shanika writes poems

ෂානිකා රයිට්ස් පොයම්ස්

ෂානිකා කවි ලියනවා

We water the plants everyday

වී වෝට(ර්) ද ප්ලාන්ට්ස් එව්රිඩේ

අපි හැමදාම පැල වලට වතුර දානවා

It rains hard these days

ඉට් රේන්ස් හාඩ් දීස්ඩේස්

මේ දවස්වල තදින් වහිනවා

( වහිනවා කියන ක්‍රියාව කරන කෙනෙක් නැති නිසා එතන කතෘ විදියට it කියන වචනේ යෙදෙනවා . එවිට එය ඒක වචන කතෘ කෙනෙක් , ක්‍රියාව අගට s අකුරක් යෙදෙනවා )

Sri Lankans like cricket very much

ශ්‍රී ලංකන්ස් ලයික් ක්‍රිකට් වෙරි මච්

ශ්‍රී ලාංකිකයෝ ක්‍රිකට් වලට ගොඩක් කැමතියි.

We play cricket after school

වී ප්ලේ ක්‍රිකට් ආෆ්ට(ර්) ස්කූල්

ඉස්කෝලෙන් පස්සේ අපි ක්‍රිකට් සෙල්ලම් කරනවා

Buses run every 15 minutes on this road

බසස් රන් එව්රි ෆිෆ්ටීන් මිනිට්ස් ඔන් දිස් රෝඩ්

හැම මිනිත්තු 15 කට සැරයක් මේ පාරේ බස් දුවනවා

I go to sleep very late

අයි ගෝ ටු ස්ලීප් වෙරි ලේට්

මං නිදාගන්න යන්නේ ගොඩාක් රෑ වෙලා

He gets up very early

හී ගෙට්ස් අප් වෙරි අ(ර්)ලි

ඔහු ගොඩක් උදෙන් නැගිටිනවා

She goes to an English class

ෂී ගෝස් ටු ඇන් ඉංග්ලිෂ් ක්ලාස්

ඇය ඉංග්‍රීසි පන්තියකට යනවා (go වලට s එකතු වෙන්නේ es විදියට )

She sings very well

ෂී සිංග්ස් වෙරි වෙල්

ඇය ඉතා හොදින් ගායනා කරනවා

He watch<u>es</u> English movies

හී වොචස් ඉංග්ලිෂ් මූවීස්

ඔහු ඉංග්‍රීසි චිත්‍රපටි බලනවා (මෙහිදීත් watch වලට s එකතු වෙන්නේ es විදියට. එවිට ශබ්ධ වෙන්නේ වොචස් කියල )

He come<u>s</u> here every weekend

හී කම්ස් හියර්) එව්රි වීකෙන්ඩ්

ඔහු හැම සති අන්තෙම මෙහෙ එනවා

- නැවතත් මේ කාරණය මතක් කරන්න කැමතියි . ඉහත උදාහරණ දෙස නැවත බැලුවොත් ඔබට පෙනෙයි ඒවායේ ඒක වචන කතෘන් සිටින වාක්‍යය වල ක්‍රියා පදය අගට s අකුරක් එකතු වී තිබෙනවා . We, farmers, dogs,children, sri lankans වැනි බහු වචන කතෘන් සමග ක්‍රියාව අගට s අකුරක් එකතු වී නැහැ .I සහ you සමගත් එසේ එකතු වී නැහැ . I සහ you මෙහිදී බහු වචන වගේ සැලකෙනවා

මෙතෙක් දුන් උදාහරණ වලින් ලබා ගත් දැනුම අනුව ඔබට පුළුවන් වේවි පහත අභ්‍යාසය කරන්න.

කතෘ ඒක වචන ද බහුවචනද යන්න සලකා බලා ක්‍රියා පදයට S අකුරක් එකතු විය යුතු දැයි තීරණය කරන්න. පළමු වාක්‍යය ඔබ වෙනුවෙන් දී තිබෙනවා.

Ex: - 9

01. අපි පෝයදාට පන්සලට යනවා
    [Go/goes, to the temple, we, on Poya days]
    [ගෝ /ගෝස් ,ටු ද ටෙම්පල් ,වී ,ඔන් පෝය ඩේස් ]
    We go to the temple on Poya days

02. අපේ ටීචර්) හැමදාම පැමිණීමේ ලේඛනය ලකුණු කරනවා
    [Mark/ marks, our teacher, everyday, the attendance register]
    [මාක් /මාක්ස් ,අවර්) , එව්රි ඩේ , ද ඇටෙන්ඩන්ස් රෙජිස්ටර්) ]

03. තාත්තාට සමහර වෙලාවට කේන්ති යනවා
[Get/ gets angry, father, sometimes]
[ගෙට් / ගෙට්ස් ඇංග්‍රි, ෆාද(ර්) ,සම්ටයිම්ස් ]

04. අම්මා අපේ රෙදි හෝදනවා
[Wash/ washes, mother, our clothes]
[වොෂ් /වොෂස්, මද(ර්), අව(ර්) ක්ලෝද්ස් ]

05. ගොවියෝ එළවළු වවනවා
[Grow/grows, vegetables, farmers]
[ග්‍රෝ / ග්‍රෝස් , වෙජිටබල් ,ෆාම(ර්)ස් ]

06. අපේ ටීච(ර්) සමහර වෙලාවට අපිට දඬුවම් කරනවා
[Punish/ punishes us, our teacher, sometimes]
[පනිෂ් /පනිෂස් අස් ,අව(ර්) ටීච(ර්) ,සම්ටයිම්ස් ]

07. අපේ ස්කෝලේ උදේ 8 ට පටන් ගන්නවා
[Start/ starts, our school, at 8 am]
[ස්ටාට් /ස්ටාට්ස් , අව(ර්) ස්කූල් ,ඇට් එයිට් ඒ එම් ]

08. මම හැමදාම ඇයව දකිනවා
[See/sees, I, her, everyday]
[ සී /සීස් ,අයි ,හ(ර්), එව්රිඩේ ]

09. අපි එකිනෙකා හඳුනනවා
[Know/ knows, we, each other]
[නෝ /නෝස් ,වී ,ඊච් අද(ර්) ]

10. ඔහු හොඳට මාව දන්නවා
[Know/ knows, he, me, well]
[නෝ /නෝස් ,හී ,මී ,වෙල් ]

11. අපි එළවළු ගන්නේ ඉරිදා පොලෙන්
[Buy/ buys, vegetable, we, at the Sunday fair]
[බයි /බයිස් ,වෙජිටබල් ,වී ,ඇට් ද සන්ඩේ ෆෙයා(ර්) ]

12. මම සංගීතයට සවන් දෙනවා
[Listen to/ listens to, I, music, as a hobby]
[ලිස්න් /ලිස්න්ස් ටු ,අයි ,මියුසික් , ඇස් අ හොබි ]

13. ඇය චතුර ලෙස ඉංග්‍රීසි කතා කරනවා
[Speak/ speaks, she, English, fluently]
[ ස්පීක් /ස්පීක්ස් , ෂී , ඉංග්ලිෂ් , ෆ්ලුවන්ට්ලි ]

14. අපි රෑට සැහැල්ලු කෑම වේලක් ගන්නේ
[Take/takes, we, a light meal, for dinner]
[ ටේක් /ටේක්ස් , වී ,අ ලයිට් මීල් ]

15. මට සල්ලි ටිකක් ඕනා
[Want/wants, I, some money]
[ වෝන්ට් /වෝන්ට්ස් , අයි , සම් මනී ]

Lesson 14 **Spoken English**

ස්තුති කිරීමකට ප්‍රතිචාර දක්වන තවත් ආකාර කිහිපයක් අපි මේ පාඩමේදී ඉගෙන ගනිමු. ස්තුතී කිරීමකට ප්‍රතිචාර දක්වන තවත් සුලභ වැකියක් තමයි Don’t mention it (ඩෝන්ට් මෙන්ෂන් ඉට් ) කියන එක . “එය සදහන් කරන්න එපා / එය සදහන් කරන්න අවශ්‍ය නෑ “ කියන එක ඉන් අදහස් වෙන්නේ, සමහර විට අපි සිංහල ව්‍යවහාරයේත් මෙවැනි අවස්ථා වල ඇතැම් විට සදහන් කරනවා “ අනේ ඕක කියන්නත් දෙයක්ද ?” කියලා . මෙය එයට සමානයි . බලමු උදාහරණ

Dialogue 1

A: Thank you for explaining the lesson to me

තැන්ක් යූ ෆෝ එක්ස්ප්ලේනිං ද ලෙසන් ටු මී

මට පාඩම පැහැදිලි කලාට ඔයාට ස්තූතියි

B: Don’t mention it !

ඩෝන්ට් මෙන්ෂන් ඉට්

එය සදහන් කරන්න අවශ්‍ය නෑ

Dialogue 2

A: Thanks for helping me with this work

තැංක්ස් ෆෝ හෙල්පිං මී විත් දිස් ව(ර්)ක්

මේ වැඩේට මට උදව් කලාට ස්තූතියි

B: Don’t mention it !

ඩෝන්ට් මෙන්ෂන් ඉට්

එය සදහන් කරන්න අවශ්‍ය නෑ

Dialogue 3

A: Thank you so much for your advice.

තැංක් යූ  සෝ මච්  ෆෝ යුව(ර්) ඇඩ්වයිස්

ඔයාගේ උපදේශයට ගොඩාක් ස්තූතියි

B: Don’t mention it!

ඩෝන්ට් මෙන්ෂන් ඉට්

එය සදහන් කරන්න අවශ්‍ය නෑ

ස්තූති  කිරීමකට ප්‍රතිචාර වශයෙන් මෙයත් කියන්න පුලුවන්.

It’s nothing - ඉට්ස් නතිං - ඒක  මහා දෙයක් නෙවෙයි / ඒක සුළු දෙයක් .

අපි සිංහලෙන් වුනත් සමහර අවස්ථාවල එහෙම කියනවා “ අනේ ඕක මොකක්ද  ? / අනේ ඕක මහා ලොකු දෙයක්ද ? “කියලා . මෙය ඊට සමානයි . උදාහරණ බලමු

Dialogue 4

A: Thanks for coming with me

තැංක්ස් ෆෝ කමිං විත් මී

මාත් එක්ක ආවට ගොඩක් ස්තුතියි

B: It's nothing!

ඉට්ස් නතිං

ඒක සුළු දෙයක්

Dialogue 5

A: Thank you for giving me your calculator.

තැන්ක් යූ ෆෝ ගිවිං මී යුව(ර්) කැල්කියුලේට(ර් )

ඔයාගේ කැල්කියුලේට(ර්) එක මට දුන්නට ඔයාට ස්තුතියි

B: It's nothing!

ඉට්ස් නතිං

ඒක සුළු දෙයක්

Dialogue 6

A: Thanks for spending your time for me

තැංක්ස් ෆෝ ස්පෙන්ඩිං යුව(ර්) ටයිම් ෆෝ මී

මං වෙනුවෙන් ඔයාගේ කාලය වැය කලාට ස්තුතියි

B: It's nothing!

ඉට්ස් නතිං

ඒක සුළු දෙයක්

සමහර අවස්ථා වල මේ යෙදුමත් ඉංග්‍රීසි කතා කරන්නන් භාවිතා කරනවා ස්තුතිය පිළිගන්න . No problem - නෝ ප්‍රොබ්ලම් . ඉන් අදහස් වෙන්නේ උදව් කිරීම මහා ලොකු දෙයක් / ලොකු ප්‍රශ්නයක් වුනේ නෑ කියන එක

Dialogue 7

A: Thanks for helping me with my homework.
තැංක්ස් ෆෝ හෙල්පින් මී විත් මයි හෝම්ව(ර්)ක්
මගේ ගෙදර වැඩ වලට උදව් කලාට ස්තුතියි

B: No problem.
නෝ ප්‍රොබ්ලම්
ප්‍රශ්නයක් නෑ

Dialogue 8

A: Thank you for the pencil.
තැංකියූ ෆෝ ද පෙන්සිල්
පැන්සලට(පැන්සල දුන්නට) ස්තුතියි

B: No problem
නෝ ප්‍රොබ්ලම්
ප්‍රශ්නයක් නෑ

තවත් සමහර අවස්ථා වල That 's okay - දැට්ස් ඕකේ කියන යෙදුමත් භාවිතා වෙනවා. එහිදීත් අදහස් වෙන්නේ උදව් කිරීම ලොකු ගැටළුවක් නොවූ බව

Dialogue 9

A: Thanks for carrying my bag.
තැන්ක්ස් ෆෝ කැරීන් මයි බෑග්.

මගේ බෑග් එක අරන් ආවට ස්තුතියි

B: That's okay.
දැට්ස් ඕකේ

ඒක කමක් නෑ

හොඳයි , මේ ඉගෙන ගත් හැම දේම හොඳින් මතක තබා ගන්න . ඔබට ඒවා පාවිච්චි කිරීමට අවස්ථාව ලැබෙන හැමවිටම නොපැකිලව ඒවා පාවිච්චි කරන්න. තවත් රසවත් Spoken English පාඩමක් ඊලග පාඩමේදීත් බලාපොරොත්තු වන්න

**Vocabulary** 14

මේ පාඩමේ වචන මාලාවට මේ පාඩමේ මුල තිබුණු ක්‍රියාපද ලැයිස්තුව ඇතුලත් . ඒ සමහර ක්‍රියාපද ඔබ මීට කලින් දැන ගෙන ඇති. නමුත් නැවතත් ඒ සියලු ක්‍රියාපද පාඩම් කරගන්න. ඊට අමතරව මේ පාඩමේදී අපට හමුවුණු අලුත් ක්‍රියාපද කීපයකුත් පහත දී තිබෙනවා. ඉහත ක්‍රියා පද ලැයිස්තුව අනිවාර්යයෙන් පාඩම් කල යුතුයි.

sweetmeat – ස්වීට් මීට් – රස කැවිල්ල

light – ලයිට් – ආලෝකය / සැහැල්ලු

light meal – ලයිට් මීල් – සැහැල්ලු ආහාරය

attendance – අටෙන්ඩන්ස් – සහභාගි වීම

attendance register – අටෙන්ඩන්ස් රෙජිස්ට(ර්) – පැමිණීමේ ලේඛනය

wake up – වේකප් – ඇහැරෙනවා

get up – ගෙටප් – නැගිටිනවා

news – නිව්ස් – පුවත

television – ටෙලිවිෂන් – රූපවාහිනිය

work – ව(ර්)ක් – වැඩ කරනවා

cook – කුක් – උයනවා

bark – බාක් – බුරනවා

water – වෝට(ර්) – වතුර/ වතුර දානවා

plant – ප්ලාන්ට් – පැළය

everyday – එව්රිඩේ – දිනපතා

rain – රේන් – වහිනවා / වැස්ස

rain hard – රේන් හා(ර්)ඩ් – තදින් වහිනවා

minute – මිනිට් – විනාඩිය

weekend – වීකෙන්ඩ් – සති අන්තය

temple – ටෙම්පල් – විහාරය / පන්සල

get angry – ගෙට් ඇංග්‍රි – කේන්ති ගන්නවා

clothes – ක්ලෝත්ස් – ඇඳුම්

punish – පනිෂ් – දඩුවම දෙනවා

sometimes – සම්ටයිම්ස් – සමහර වෙලාවට

start – ස්ටාට් – ආරම්භ කරනවා

know – නෝ – දන්නවා

each other – ඊච් අද(ර්) – එකිනෙකා

vegetable – වෙජිටබල් – එළවලු

fluently – ෆ්ලුවන්ට්ලි – චතුර ලෙස

explain – එක්ස්ප්ලේන් – පැහැදිලි කරනවා

mention – මෙන්ෂන් – සඳහන් කරනවා

advice – ඇඩ්වයිස් – උපදෙස

calculator – කැල්කියුලේට(ර්) – විද්‍යුත් ඝනකය

spend – ස්පෙන්ඩ් – වැය කරනවා

carry – කැරී – ගෙනියනවා / ඔසවන් යනවා